**ශීර්ෂය - 151 ධීවර අමාත්‍යාංශය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ධීවර අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ධීවර අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 26 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූනි 13 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ධීවර අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 3.1.1(ඇ) | විගණනයට අවශ්‍ය විස්තර ඉදිරිපත් නොකිරීම | 1.6.1(ඉ) |

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ අයවීම් හිඟ හිටි තිබුණු ණය ශේෂවල එකතුව රු.1,095,938 ක්වූ අතර, එම හිඟ හිටි ශේෂවලින් රු.956,055 ක් හෙවත් සියයට 87 ක් වර්ෂ 5 ට වැඩි කාල පරාසයක් ගත වී තිබුණත් එම හිඟ හිටි ණය ශේෂ සමාලෝචිත වර්ෂයේ ද අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි. | හිඟ හිටි ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධව ත්‍රිපුද්ගල කමිටුවක් පත්කර ඇති අතර වර්තමානය වන විට අයකර ගැනීමට අපහසු ණය ශේෂ කපා හැරීමටත් අයකර ගත හැකි ණය ශේෂ අයකර ගැනීමටත් එම කමිටුව මඟින් නිර්දේශ ලබා දී ඇත. | හිඟ හිටි ණය ශේෂ අයකර ගත යුතුය. |
| (ii) | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් 'බී' ගිණුමේ භාණ්ඩාගාර පොත් අනුව වර්ෂය තුළ හර කිරීම්වල එකතුව රු.11,763,453 ක්ද, දෙපාර්තමේන්තු පාලන ගිණුමේ හර කිරීම්වල එකතුව රු.11,625,453 ක්ද ,ඒකාබද්ධ විස්තරාත්මක ශේෂ පිරික්සුමේ හර කිරීම්වල එකතුව රු.8,863,593 ක් ද, භාණ්ඩාගාර පොත් අනුව බැර කිරීම්වල එකතුව රු.10,158,023 ක්ද දෙපාර්තමේන්තු පාලන ගිණුමේ බැර කිරීම්වල එකතුව රු.10,020,023 ක්ද, සහ ඒකාබද්ධ විස්තරාත්මක ශේෂ පිරික්සුමේ බැර කිරීම්වල එකතුව රු.9,860,004 ක්ද වශයෙන් වෙනස්කම් නිරීක්ෂණය විය. | සේවා ස්ථාන මාරු වී පැමිණි නිලධාරියකුගේ පැවති රු.138,000 ක ණය මුදල පාලන ගිණුමට හර කර අමාත්‍යාංශ ශීර්ෂයටම බැර සටහන ද ඇතුළත් කර ඇත. මෙම වරද පසුව නිවැරදි කළ ද එම වරද නිවැරදි කිරීම පාලන ගිණුමට ඇතුළත් නොකිරීම නිසා මෙම වෙනස ඇති වී ඇත. ශේෂ පිරික්සුමෙහි වෙනසක් පවතින අතර ධීවර රාජ්‍ය අමාත්‍යාංශයේ සහ අමාත්‍යාංශයේ ගිණුම් අතර ජ'නල් මඟින් පැවරීම් සිදුකිරීමේ දී ගිණුම් පද්ධතිවල ඇති දෝෂයක් මත මෙම වෙනස සිදු වී ඇත. | භාණ්ඩාගාර පොත් අනුව ශේෂ ඊට අදාළ පාලන ගිණුමේ හා ශේෂ පිරික්සුමේ ශේෂයට සමාන විය යුතුය. |

**(ආ)තැන්පතු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මු.රෙ. 571(3) ප්‍රකාරව, ධීවර අමාත්‍යාංශයේ වර්ෂ 2 ඉක්ම වූ එකතුව රු.54,561,722 ක තැන්පතු ශේෂ නිරවුල් කිරීමට හෝ රජයේ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | ධීවර අමාත්‍යාංශයේ අනුයුක්ත ආයතනවලින් තැන්පත් කළ තැන්පතු රැඳවුම් මුදල් පිළිබඳ එම ආයතනවලින් කැඳවීම් සිදුකර ඇති අතර ඉදිරියේ දී රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරනු ඇත. | මු.රෙ. 571(3) ප්‍රකාරව වර්ෂ 2 ඉක්ම වූ තැන්පතු ශේෂ නිරවුල් කිරීමට හෝ රජයේ ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | දළ රළ සවිය 2022 - ලෝක ධීවර දිනය වෙනුවෙන් විවිධ ආයතන විසින් ධීවර අමාත්‍යාංශය වෙත රු.3,250,000 ක මූල්‍යාධාර ලබා දී තිබුණු අතර එයින් රු.2,741,648 ක වියදම් කර ඉතිරි රු.508,352 ක මුදල රාජ්‍ය ආදායමට බැරකර නොතිබුණි. | මෙම තැන්පතු පිළිබඳව තවදුරටත් පරීක්ෂා කර පොදු තැන්පත් ගිණුමේ ඉතිරි මුදල් ඉදිරියේ දී රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරනු ඇත. | පොදු තැන්පත් ගිණුමේ රඳවා ඇති දළ රළ සවිය 2022-ලෝක ධීවර දිනය වෙනුවෙන් ලැබූ මුදලින් ඉතිරි මුදල් රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කළ යුතුය. |
| (iii) | රැඳවුම් මුදල් තැන්පතු ගිණුමේ කේවල ශේෂ ලැයිස්තුවෙහි එකතුව රු.85,252,201 ක් වන අතර වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ (4) ආකෘතිය යටතේ වන මෙම තැන්පතු ගිණුමෙහි ශේෂය රු.83,251,173 ක් වූයෙන් රු.2,001,028 ක වෙනසක් පැවතුණි. | ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය විසින් ලබාදුන් එම ආයතනයට අදාළ තැන්පත් කරුවන්ගේ තොරතුරු අනුව එම වෙනස ඇති වී ඇති අතර එය නිවැරදි කරන ලෙස ආයතනයට ලිඛිතව දැනුම් දෙන ලදී. | තැන්පතු ගිණුමේ ශේෂය හා කේවල ශේෂ ලැයිස්තුවේ එකතුව සමාන විය යුතුය. |

**(ඇ) දේපළ පිරියත හා උපකරණ**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට ධීවර අමාත්‍යාංශය සතු රු.721,915,845 ක වටිනාකමින් යුත් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ විස්තරාත්මක උපලේඛන විගණනයට ලබා දී නොතිබූ අතර ස්ථාවර වත්කම් සමීක්ෂණ වාර්තා ද විගණනයට ඉදිරිපත් නොවූ බැවින් එම වත්කම් පරීක්ෂා කිරීමට හෝ මෙම වත්කම් භෞතිකව ආයතනය සතුව පවතී ද යන්න පරීක්ෂා කිරීමට හෝ නොහැකි විය. එබැවින් රු.721,915,845 ක මූල්‍ය නොවන වත්කම්වල නිරවද්‍යතාවය පිළිබඳ විගණනයේ දී සෑහීමකට පත්විය නොහැක. | 2022 දෙසැම්බර් 31 දිනට ඇති මුළු වත්කම් වලට අදාළ සවිස්තරාත්මක ලේඛන පිටු විශාල ගණනක් ඇති බැවින් එහි සාරාංශ ලේඛන පමණක් මුද්‍රිත පිටපත් ලෙස ලබාගන්නා අතර එහි පිටපත් විගණනය වෙත ඉදිරිපත් කරන ලදී. වත්කම් සවිස්තරාත්මක ලේඛයන්හි මෘදු පිටපත් රජයේ විගණන අංශයේ ඊමේල් ලිපිනය වෙත යොමුකර ඇත. | වාර්ෂිකව වත්කම් සමීක්ෂණය කර එම වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

**(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | | |
| මු.රෙ. 454(2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | භාණ්ඩ ලේඛන පොතක් පවත්වාගෙන යාමට කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත. | රජයේ ගොඩනැගිලිවල සියලුම විදුලි උපාංග හා උපකරණ පිළිබඳ බඩු ලේඛන පොතක් පවත්වා ගත යුතුය. |
| (ii) පොත් නාමාවලිය | | |
| මු.රෙ. 454(3) ප්‍රකාරව පොත් නාමාවලිය පවත්වා නොතිබුණි. | පොත් නාමාවලිය පවත්වාගෙන යාමට කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත. | පොත් නාමාවලියක් පවත්වා ගත යුතුය. |

**(ඉ) විගණන සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂයේ ප්‍රතිශෝධිත ඇස්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් ලෙස රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා ධීවර විෂයයන්ට සහ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා ව්‍යාවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම සඳහන් කර තිබුණ ද අමාත්‍යාංශය යටතේ පවතින ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය, ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව යන ආයතන සඳහා සමාලෝචිත වර්ෂයේ රු.1,753,907,569 ක් ලබා දී තිබුණ ද එම ආයතන පිළිබඳ පසුවිපරම් කිරීම හා ඇගයීම සිදුකර නොතිබුණි. | අක්මුදල් නිදහස් කිරීම සෘජුවම මහා භාණ්ඩාගාරය හරහා අදාළ ආයතන වෙත ලබාදීම සිදුවේ. එම තොරතුරු ගිණුම්ගත කිරීමට අදාළ පොත්පත් එම ආයතන තුළ පවතින බැවින් එම ආයතන විගණනයෙන් කරුණු තහවුරු කරගත හැකි වේ. අමාත්‍යාංශය වෙත ගෙන්වා ගනු ලබන්නේ සාරාංශවල කොටසක් පමණි. | අමාත්‍යාංශය යටතේ නියාමනය වන මෙම රාජ්‍ය ආයතන 3 හි කාර්ය සාධනය පිළිබඳ පසුවිපරම් කිරීම අමාත්‍යාංශය විසින් සිදුකළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශයේ සමාලෝචිත වර්ෂය සඳහා අවශ්‍ය අග්‍රිමය රු.2,172,185,000 ක් වුවද භාණ්ඩාගාරය විසින් රු.371,137,000 ක් නිදහස් කිරීම නිසා අග්‍රිම සැලසුම් කිරීම මඟින් අපේක්ෂා කර තිබූ අපනයන වෙළඳපොළ ඉලක්ක කර සුරතල් මත්ස්‍ය කර්මාන්තය සඳහා පහසුකම් වැඩි දියුණු කිරීම, උපායශීලී සැලසුම් සකස් කිරීම මඟින් දිවයින ඇතුළත වැව්, කලපු සහ ගොඩබිම ධීවර කටයුතු වර්ධනය කිරීම, බහුදින ධීවර යාත්‍රා සඳහා මුහුදු ජලය භාවිතයෙන් ශීතකරණ පද්ධතියක් වැඩි දියුණු කිරීම සහ සූර්යබල ශක්ති භාවිතය දිරිමත් කරවීම, ධීවර වරායන් සහ නැංගුරම් පොළවල්වල අයිස් යන්ත්‍රාගාර, නවීන සන්නිවේදන පහසුකම්, ඉන්ධන සැපයුම් සහ සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම, ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය හා ධීවර ප්‍රජා සංවිධාන අතර මුහුදු හා මිරිදිය මත්ස්‍ය ගහනය වර්ධනය කරගත හැකි අවබෝධාත්මක වැඩසටහන් ආරම්භ කිරීම, පාරිසරික හිතකාමී උසස් තාක්ෂණය භාවිතයෙන් මත්ස්‍ය අස්වැන්න වැඩිකිරීම සහ ධීවර කර්මාන්තවල නියැලී පුද්ගලයින් සඳහා වෘත්තීය පුහුණුව දීම වැනි ප්‍රධාන අරමුණු ඉටු වී නොතිබුණු අතර, පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන සැලසුම් කළ පරිදි උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි. | ආර්ථික අර්බුදය හේතුවෙන් විදේශවලින් ආනයනය කරනු ලබන අමුද්‍රව්‍ය සඳහා දැඩි සීමාවන් පනවන ලද අතර, ඒ හේතුවෙන් මෙරට ධීවර කර්මාන්තය ආශ්‍රිත ව්‍යාපෘති සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක කිරීමට දුෂ්කර වී තිබුණි. තව ද ඉන්ධන හිඟය නිසා මෙම තත්ත්වය වඩා අයහපත් වූ අතර, අමාත්‍යාංශ අක්මුදල්වලින් ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය හා ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය මඟින් ඉල්ලුම් කරන ලද අක්මුදල් භාණ්ඩාගාරයෙන් නොලැබීම නිසා සංවර්ධන ව්‍යාපෘතිවල අදාළ ප්‍රතිපාදන සැලසුම් කරන ලද අක්මුදල් භාණ්ඩාගාරයෙන් නොලැබීම නිසා සංවර්ධන ව්‍යාපෘතිවලට අදාළ ප්‍රතිපාදන සැලසුම් කළ පරිදි උපයෝජනය කළ නොහැකි විය. | අමාත්‍යාංශයේ මූලික අරමුණු ඉටුකර ගැනීම පිළිබඳ විශේෂ අවධානය යොමු විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ධීවර අමාත්‍යාංශයේ සමාලෝචිත වර්ෂය සඳහා අවශ්‍ය අග්‍රිමය රු.9,658,227,000 ක් වුවද භාණ්ඩාගාරය විසින් රු.2,228,832,931 ක් නිකුත් කිරීම නිසා අග්‍රිම සැලසුම් කිරීම මඟින් අපේක්ෂා කර තිබූ වෙරළබඩ ප්‍රදේශවල මත්ස්‍ය ගහනය ඉහළ නැංවීම සඳහා විද්‍යාත්මක ක්‍රමවේදයන් හඳුන්වා දීම, අන්තර්ජාතික මුහුදු ප්‍රදේශයේ මසුන් ඇල්ලීම පුළුල් කිරීම සඳහා දේශීය සමාගම්වලට අවස්ථාවන් ලබාදීම, ටින්මාළු කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා පෞද්ගලික සමාගම් සහ ආයෝජකයින් දිරිගැන්වීම, නිෂ්පාදනයට සහ පාරිභෝගිකයාට ද සාධාරණය ඉටුවන ආකාරයට මත්ස්‍ය නිෂ්පාදනය සඳහා අලෙවි සංවර්ධන කටයුතු පුළුල් කිරීම, උතුරු හා නැගෙනහිර මුහුදේ අනවසරයෙන් මසුන් ඇල්ලීම තුරන් කිරීම සහ නාවික හා වෙරළාරක්ෂක ඒකක ශක්තිමත් කිරීම හා ඉන්දියාව සමඟ ගැටුම් නිරාකරණය කිරීම, ධීවර ප්‍රජාව සඳහා ඵලදායී බැංකු හා රක්ෂණ ක්‍රමයන් හඳුන්වාදීම, සාගර විශ්වවිද්‍යාලය භාවිතා කර තරුණ තරුණියන් සඳහා ධීවර කටයුතු පිළිබඳ තාක්ෂණික හා කළමනාකරණ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැනි ප්‍රධාන අරමුණු ඉටු වී නොතිබුණු අතර, පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන සැලසුම් කළ පරිදි උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි. | 2022 වර්ෂයේ ඇති වූ ආර්ථික අර්බුදය හේතුවෙන් විදේශවලින් ආනයනය කරනු ලබන අමුද්‍රව්‍ය සඳහා දැඩි සීමාවන් පනවන ලද අතර, ඒ හේතුවෙන් මෙරට ධීවර කර්මාන්තය ආශ්‍රිත ව්‍යාපෘති සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක කිරීමට දුෂ්කර වී තිබුණි. තව ද වර්ෂයේ දෙවන කාර්තුව වනවිට පැවති ඉන්ධන හිඟය නිසා මෙම තත්ත්වය වඩා අයහපත් වූ අතර, අමාත්‍යාංශ අක්මුදල්වලින් ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය හා ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය මඟින් ඉල්ලුම් කරන ලද අක්මුදල් භාණ්ඩාගාරයෙන් නොලැබීම නිසා සංවර්ධන ව්‍යාපෘතිවලට අදාළ ප්‍රතිපාදන සැලසුම් කළ පරිදි උපයෝජනය කළ නොහැකි විය. | අමාත්‍යාංශයේ මූලික අරමුණු ඉටුකර ගැනීම පිළිබඳ විශේෂ අවධානය යොමුකළ යුතුය. |

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වැය විෂයයන් 3 ක් හා මූලධන වැය විෂයයන් 4 ක් ඇතුළුව වැය විෂයයන් 7 ක් සඳහා සලසාගෙන තිබුණු එකතුව රු.2,930,000 ක මූලික ප්‍රතිපාදනයෙන් රු.400,000 ක් වෙනත් වැය විෂයයකට මාරු කිරීමෙන් පසුව රු.2,530,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | විනිමය අවම වීම සහ විනිමය අනුපාත ඉහළ යාමත් සමඟ විදේශ ගමන් සීමා කිරීම, අක්මුදල් ලබා ගැනීමේ ගැටලුව නිසා පුහුණු පාඨමාලා සීමා කිරීම් සිදුවීම සහ යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ නඩත්තු වියදම් දැරීමට සිදු නොවීම නිසා ප්‍රතිපාදන ඉතිරි විය. | නිවැරදිව හා තාත්විකව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පුනරාවර්තන වැය විෂයයන් 08 ක් හා මූලධන වැය විෂයයන් 02 ක් සඳහා සලසාගෙන තිබුණු රු.56,050,000 ක් වූ මූලික ප්‍රතිපාදනයෙන් රු.20,160,300 ක් වෙනත් වැය විෂයයන්ට මාරු කිරීමෙන් පසුව රු.35,889,700 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.33,409,351 ක ප්‍රතිපාදන උපයෝජනයට ගෙන නොතිබුණි. | රාජ්‍ය අමාත්‍යාංශය කැබිනට් අමාත්‍යාංශය වෙත පවරා ගැනීමෙන් සිදුවූ ගිණුම්කරණ කාර්යයෙහි ප්‍රමාදය සහ අක්මුදල් ලබා ගැනීමේ පැවති සීමාවන් නිසා ප්‍රතිපාදන ඉතිරි විය. තවද සම්මාදම් සහ දායක මුදල් ගෙවීම් නතර කිරීම සහ විදේශ ණය ලබා ගැනීම් සීමා කිරීම නිසා ව්‍යාපෘති වියදම් කටයුතුද නතර කිරීමට සිදු වීම නිසා ප්රතිපාදන ඉතිරි විය. | නිවැරදිව හා තාත්විකව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මු.රෙ. 94(1) පටහැනිව මෙහෙයුම් වැය විෂයයකට ලබා දී තිබුණු ප්‍රතිපාදනයන්හි ඉතිරිය ඉක්මවා රු.40,987,670 ක බැරකම්වලට එළඹී තිබුණු අතර සංවර්ධන වැය විෂයයන් 2කට ලබා දී තිබුණු ප්‍රතිපාදනයන්හි ඉතිරිය ඉක්මවා රු.353,778,496 ක් බැරකම්වලට එළඹී තිබුණි. ඒ අනුව එකතුව රු.394,766,166 ක ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි. | 2022 වර්ෂය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් පිළියෙල කළ වියදම් ඇස්තමේන්තුව තුළ අදාළ වර්ෂයට අවශ්‍ය වේ යැයි හැඟුන ඉහත ප්‍රතිපාදන ප්‍රමාණයක් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණ ද අමාත්‍යාංශය වෙත ලැබුණේ සීමිත ප්‍රතිපාදන ප්‍රමාණයක් පමණි. අමාත්‍යාංශය ප්‍රතිපාදන සීමා සහිතව භාවිතා කළ ද දැරිය යුතුම වූ වියදම් සඳහා ද ලැබුණු ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹීමට සිදු විය. | බැරකම් කිසිම විටක මුදල් වර්ෂය සඳහා වූ ප්‍රතිපාදන මුදල් නොඉක්මවිය යුතුය. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම (iii) හි මෙහෙයුම් වැඩසටහනට හා සංවර්ධන වැඩසටහනට අදාළව 2022 දෙසැම්බර් 31 දිනට බැරකම් ශේෂය රු.1,165,662,699 ක් වන අතර, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත SA 92 වාර්තාව අනුව භාණ්ඩාගාරය විසින් අනුමත කර ඇති බැරකම් ශේෂය රු.740,916,331 ක් විය. මේ අනුව අමාත්‍යාංශ බැරකම් විස්තරය සහ භාණ්ඩාගාර බැරකම් විස්තරය අතර රු.424,746,368 ක වෙනසක් නිරීක්ෂණය වන අතර වෙනසට හේතු | SA 92 වාර්තාව සඳහා දත්ත ඇතුළත් කළ හැක්කේ වැය විෂයන් සඳහා ලබාදුන් ප්‍රතිපාදන සීමාව දක්වා පමණි. මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම iii හි අමාත්‍යාංශය සතු සියලුම බැරකම් ඇතුළත් කර දැක්වීම එම වෙනසට හේතු වේ. | වාර්ෂික ඇස්තමේන්තුවල මුදල් ප්‍රතිපාදන ඇති විට පමණක් අමාත්‍යාංශය විසින් වැඩක් සේවයක් හෝ සැපයුමක් සඳහා වියදමකට හෝ බැඳීමකට හෝ බැඳී සිටිය යුතුය. |

අනාවරණය කරගෙන ද නොතිබුණි. මේ අනුව ධීවර අමාත්‍යාංශය විසින් භාණ්ඩාගාරයට වාර්තා නොකළ රු.424,746,368 ක වටිනාකමින් යුත් බැරකම් සඳහා එළඹ තිබූ බව නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලසුම් කිරීම

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

<table>
<tr><th></th><th>විගණන නිරීක්ෂණය</th><th>ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම</th><th>නිර්දේශය</th></tr>
<tr><td>(අ)</td><td>ධීවර අමාත්‍යාංශයේ 2022 වර්ෂයේ ඇස්තමේන්තුව මඟින් සුවිශේෂි ප්‍රමුඛතා කාර්යයන් 9 ක් හඳුන්වා දී තිබුණ ද, පහත සඳහන් කාර්යයන් ඉටුකිරීම සතුටුදායක මට්ටමක නොවීය.</td><td></td><td></td></tr>
<tr><td>(i)</td><td>වෙරළබඩ ප්‍රදේශවල මත්ස්‍ය ගහනය ඉහළ නැංවීම සඳහා විද්‍යාත්මක ක්‍රමවේදයන් හඳුන්වා දීම.</td><td>මත්ස්‍ය ගහණය ඉහළ නැංවීම සඳහා මත්ස්‍ය ඇටවුම් මධ්‍යස්ථානය ඇති කිරීමේ ව්‍යාපෘතිය ප්‍රමාද විය.</td><td rowspan="3">හඳුනාගෙන තිබෙන සුවිශේෂි ප්‍රමුඛතා කාර්යයන් ඉදිරි වර්ෂ ක්‍රියාකාරි සැලසුම්වලට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය.</td></tr>
<tr><td>(ii)</td><td>අන්තර්ජාතික මුහුදු ප්‍රදේශයේ මසුන් ඇල්ලීම පුළුල් කිරීම සඳහා දේශීය සමාගම්වලට අවස්ථාවන් ලබාදීම.</td><td>බහුදින ධීවර යාත්‍රා ලියාපදිංචිය ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සිදුකරනු ලබයි.</td></tr>
<tr><td>(iii)</td><td>ටින්මාළු කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා පෞද්ගලික සමාගම් සහ ආයෝජකයින් දිරිගැන්වීම.</td><td>ටින්මාළු කර්මාන්ත ශාලා 15 ක් මඟින් දේශීය වෙළඳ පොළට ටින්මාළු සපයනු ලබයි.</td></tr>
<tr><td>(iv)</td><td>සාගර විශ්ව විද්‍යාලය භාවිතා කර තරුණ තරුණියන් සඳහා ධීවර කටයුතු පිළිබඳ තාක්ෂණික හා කළමනාකරණ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.</td><td>ධීවර කටයුතු හා තාක්ෂණික හා කළමනාකරණ පුහුණු වැඩසටහන් අක්මුදල් ලබාදීමට නොහැකිවීම මත ක්‍රියාත්මක නොවුණි.</td><td></td></tr>
</table>

### 3.2 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්යයභාර්යයන් සහ තොරතුරු ජනගත කිරීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කරගැනීම සඳහා පත්කර තිබූ තාක්ෂණික ඇගයීම් කමිටුව ධීවර අමාත්‍යාංශයේ වෙබ් අඩවිය නිර්මාණය කළ එම ආයතනයෙන්ම මෙම කාර්යය ඉටුකර ගැනීම යෝග්‍ය බව 2021 මාර්තු 31 දින නිර්දේශ කර 2021 අප්‍රේල් 06 දින රාජ්‍ය අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් රු.250,000 ක මුදලකට එම ආයතනයෙන් වෙබ් අඩවිය නිර්මාණය කර ගැනීමට තීරණය කර තිබුණි. රු.175,000 ක් එම ආයතනය වෙත ගෙවීම් සිදුකර තිබුණ ද වෙබ් අඩවිය නිර්මාණය කර නොතිබුණි. තව ද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 ප්‍රකාරව කාර්යසාධන සුරක්ෂණයක් ලබාගත යුතු වුවත් මෙම කොන්ත්‍රාත්තුව සඳහා කාර්යසාධන සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණු බැවින් ප්‍රසම්පාදනය තුළින් ප්‍රසම්පාදන අස්ථිත්වය ආරක්ෂා කර ගැනීමට කටයුතු කර නොතිබුණි. මේ අනුව 2021 අප්‍රේල් 30 දින අත්සන් කර තිබූ ගිවිසුමේ 2 වන වගන්තිය අනුව කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කළ දින සිට සති 12 ක් තුළ මෙම වෙබ් අඩවිය නිර්මාණය කර අවසන් කළ යුතු වුවත් 2022 සැප්තැම්බර් 30 දින වන විටත් රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි වී තිබුණ ද අදාළ වෙබ් අඩවිය නිර්මාණය කර නොතිබුණි. | ධීවර රාජ්‍ය අමාත්‍යාංශය වර්තමානය වන විට අහෝසි කර ඇති අතර අනෙකුත් ඉදිරි ප්‍රසම්පාදන කටයුතු සඳහා කාර්යසාධන සුරක්ෂණයක් ලබාගැනීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබාදෙන ලදී. | වෙබ් අඩවිය සම්පූර්ණයෙන්ම නිර්මාණය කර අවසන් කර තිබිය යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

### 4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

විගණනය වෙත ඉදිරිපත් කර තිබූ තොරතුරු වලට අනුව ධීවර අමාත්‍යාංශ යටතේ 2022 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 179 ක්වූ අතර එදිනට තත්‍ය සේවක සංඛ්‍යාව 152 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට සේවක පුරප්පාඩු 46 ක්වූ අතර ද්වීතීය මට්ටමේ අතිරික්ත සේවක සංඛ්‍යාව 19 ක් විය.

මීට අදාළව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | අධ්‍යක්ෂ, අභ්‍යන්තර විගණන, ඉංජිනේරු, නියෝජ්‍ය අධ්‍යක්ෂ යන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 04 ක පුරප්පාඩු සඳහා වැඩ ආවරණ නිලධාරීන් පත්කර තිබුණ ද, අමාත්‍යාංශයේ මූලික අරමුණු ඉටුකර ගැනීමට බාධාවක් වී තිබුණි. | ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 03 ක පුරප්පාඩු ඇතත් එම පුරප්පාඩු වී ඇති තනතුරු සඳහා වැඩ ආවරණයට නිලධාරීන් පත්කර ඇති බැවින් රාජකාරි ඉටු කිරීමේ දී ප්‍රායෝගිකව ගැටලුකාරී තත්ත්වයක් මේ වන තෙක් පැන නැඟී නැත. | ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කරගත යුතුය. |
| **(ආ)** | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර, ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කර නොතිබුණි. | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සැලැස්ම සකස් කරමින් පවතී. එම චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කර තිබූ අතර එම නිලධාරියා විදේශ ගත වී ඇති බැවින් වෙනත් නිලධාරියෙකු පත් කිරීමට කටයුතු කරමින් පවතී. | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(ඇ)** | මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2020 සැප්තැම්බර් 04 දිනැති අංක DMS/SM/16 දරන ලිපිය අනුව පැවති රාජ්‍ය අමාත්‍යාංශය සඳහා අනුමත සංවර්ධන නිලධාරි සංඛ්‍යාව 10 ක් ලෙස ද අනුමත කාර්යය මණ්ඩලය සම්බන්ධව යම් සංශෝධනයක් සිදුකළ යුතු වන්නේනම් ඒ සඳහා කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු බව සඳහන්ව තිබුණ ද ධීවර රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි වන 2022 සැප්තැම්බර් 30 දින වන විට සංවර්ධන නිලධාරීන් 54 දෙනෙකු සඳහා 2022 මාර්තු සිට නොවැම්බර් දක්වා කාලය තුළ රු.19,654,380ක් වැටුප් හා වේතන වශයෙන් ගෙවීම් සිදුකර තිබුණු අතර ඒ සඳහා කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ධීවර අමාත්‍යාංශයේ අනුමත කාර්යය මණ්ඩලයේ සංශෝධනයන් සිදුකිරීම සඳහා කළමනාකරණ සේවා ජනරාල් වෙත 2022 ඔක්තෝබර් 05 දින ඉල්ලීම් කර ඇති අතර 2023 මාර්තු 17 දින කාර්ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. වැටුප් හා වේතන ගෙවීම සඳහා 130 වැය විෂයය යටතේ ප්‍රතිපාදන ලබාදීම සිදුකරන ලදී. | අනුමත කාර්යය මණ්ඩලය සම්බන්ධව යම් සංශෝධනයන් සිදුකරන අවස්ථා වලදී ඒ සඳහා කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ පූර්ව අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ඇ)** | රාජ්‍ය අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය ,රාජ්‍ය අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය හා වෙනත් ආයතන වෙත මුදාහළ කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් සිදුකළ විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) | 2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1 දරන රාජ්‍ය වියදම් කළමනාකරණය මැයෙන් නිකුත් කරන ලද ජනාධිපති කාර්යාල චක්‍රලේඛයේ 2.2 ඡේදය ප්‍රකාරව අමාත්‍යවරුන්ගේ කාර්යාලවල සේවය කරනු ලබන සහය කාර්ය මණ්ඩලය හැකිතාක් දුරට රාජ්‍ය නිලධාරීන් අතරින් තෝරා ගත යුතු බවට සඳහන් වුවත් ඊට පටහැනිව රාජ්‍ය අමාත්‍යවරයාගේ පෞද්ගලික ලේකම්වරයාගේ ඉල්ලීම මත නිලධාරීන් 17 දෙනෙකු බඳවාගෙන තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාර රාජ්‍ය නිලධාරීන් අතරින් තෝරාගත යුතු වුවත් ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ ඉල්ලීම මත කාර්ය මණ්ඩලය ලබාදීමට කටයුතු කරන ලදී. | 2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1 දරන රාජ්‍ය වියදම් කළමනාකරණය මැයෙන් නිකුත් කරන ලද ජනාධිපති කාර්යාල චක්‍රලේඛයේ 2.2 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | මු.රෙ. 201 (2) පටහැනිව අමාත්‍යවරයාගේ කාර්යාලයේ නියුතු සහය කාර්ය මණ්ඩලය සඳහා පැමිණීම හා පිටවීම අත්සන් කිරීමේ ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබියදී වැටුප් ගෙවීම, අඩ වැටුප් ගෙවීම හෝ නිවාඩු පිළිබඳ විස්තර කිසිවක් නොමැතිව මුළු කාලපරිච්ඡේදයටම අදාළව වැටුප් ගෙවා තිබුණි.ඒ අනුව 2022 ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලයට අදාළව නිලධාරීන් 22 කට රු.4,552,850ක් වැටුප් ලෙස ගෙවීමේ නිරවද්‍යතාවය තහවුරු නොවීය. | මෙම නිලධාරීන් හට පවතින රාජකාරි ස්වභාවය අනුව සේවයට වාර්තා කිරීමේ ලිහිල් ප්‍රතිපත්තිය අනුව සේවයේ යොදවන ලදී. | මු.රෙ. 201(2) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |